**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - 2022**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහය | | | |
| (i) III පරිච්ඡේදයේ 18.8.1 හා 18.8.3 වගන්තිය | දැන්වීමක් මඟින් අයදුම්පත් කැඳවීමෙන් තොරව තනතුරකට බඳවා නොගත යුතු අතර කොන්ත්‍රාත් පදනම මත සේවා නියුක්තිය වසර දෙකකට නොවැඩි විය යුතු වුවද 2013 වර්ෂයේ සිට 2019 දක්වා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් 18 දෙනෙකු සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම සේවයේ යොදවා ගෙන තිබුණි. | නියමිත වැටුප් වරප්‍රසාද සුදුසු අයදුම්කරුවන් ආකර්ෂණය කර ගැනීමට ප්‍රමාණවත් නොවීම මත පුවත්පත් දැන්වීම් පලකිරීම ඵලදායී නොවනවිට, ස්ථිර කාර්ය මණ්ඩලය නොමැතිවිට සහ නව පීඨ සහ අධ්‍යයනාංශ ආරම්භයේදී අවශ්‍ය අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල අනුමත නොකොට සිසුන් ලියාපදිංචි කරන විට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් සිදු කරනු ලබන බව. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (ii) III පරිච්ඡේදයේ 24.2 වගන්තිය | සේවා පැවරුම් පදනම මත නිලධාරීන් 94 දෙනෙකු රු.20,000 සිට රු. 100,000 දක්වා වූ මාසික දීමනා යටතේ තාවකාලික පදනමින් පත් කර තිබුණි. | සමහර විෂය ක්ෂේත්‍රවලට අදාළව තනතුරු වෙන්කර නොමැති විට සහ අධ්‍යයන හා පරීක්ෂණ ක්ෂේත්‍රවල සුවිශේෂී කාර්යයභාරයන් සඳහා පාලක සභා අනුමැතිය පරිදි සේවා පැවරුම් පදනමින් පත්කිරීම් සිදු කොට ඇති බව. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (iii) XX වෙනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම, පිටවීම සනාථ කර ගැනීමකින් තොරව වැටුප් හා දීමනා ලෙස එකතුව රු.4,247,254,286 ක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. එසේම අධ්‍යයන සහායක නිලධාරීන් 54දෙනෙකු වෙනුවෙන්ද පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව වැටුප් හා දීමනා ගෙවීම සිදු කර තිබුණි. | මෙය විශ්වවිද්‍යාල පද්ධතියටම බලපාන කරුණක් වන බැවින් මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපදෙස් ලබාදිය යුතු බව. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.965,566,887 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,938,016,934 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.972,450,047 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට විශ්වවිද්‍යාලයේ වියදම රු.1,152,033,094 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ ලාභදායී අනුපාතය සියයට 10.36ක් වූ අතර ඊට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම අනුපාතය සියයට 21.43 ක් විය. සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 3.08 : 1 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම අනුපාතය 7.98 : 1 ක් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) "මෛත්සෙවණ නිවාසය" ස්ථාපිත අක්කර 7 ක ඉඩම සඳහා රු.මිලියන 74 ක් බස්නාහිර පළාත් සභාවට ගෙවා තිබුණද එයින් අක්කර 3 ක් ලබා ගැනීම මෙතෙක් අවසන් කර නොතිබුණි. තවද ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් 2018 වර්ෂයේදී බොරලැස්ගමුව ඉඩමට රු.මිලියන 13 ක් කැස්බෑව ප්‍රාදේශීය ලේකම් වෙතද 2013 වර්ෂයේදී ඉඩම් කට්ටි 03 ක් සඳහා රු.මිලියන 2.5 ක් මහරගම ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවා තිබුණද මෙම ඉඩම් පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අපොහොසත් වී තිබුණි. | 2023.03.24 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ මත යුද්ධ හමුදාව විසින් අත්පත්කර ගෙන ඇති මෙම ඉඩම විශ්වවිද්‍යාලය වෙත භාරදෙන ලෙස දන්වා ලේකම් ආරක්ෂක අමාත්‍යාංශය වෙත 2023.03.28 දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභව විසින් ලිපියක්ද නිකුත්කර ඇත.<br>හේමචිමන දවටගහවත්ත ඉඩමෙහි හිමිකරුවන් වන්දි සමාලෝචන කමිටුවට පැමිණිල්ලක් කර ඇති අතර ඒ පිළිබඳ විභාගය අවසන් වී වාර්තාව සකස් කරමින් පවතී.<br>හෝමාගම ප්‍රාදේශීය ලේකම් විසින් අත්පත් කරගෙන විශ්වවිද්‍යාලයට 2017.07.31 දින භුක්තිය භාරදී ඇති කැකුණගහවත්ත මත්තේගොඩ ඉඩමේ අයිතිය ලියාපදිංචි කිරිම සඳහා හෝමාගම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත යොමු කර ඇති බව. | අදාළ ඉඩම් පවරා ගැනීම් කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) විදේශගතවී සිටින අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 41 දෙනෙකු නැවත සේවයට වාර්තාකර නොතිබීම හේතුවෙන් බැඳුම්කර කඩවීම මත 2022 දෙසැම්බර් 31 | 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුදලින් රු.4,864,336.29 ක් 2023.05.15 දින වන විට අයකර ගෙන ඇත. | අයවිය යුතු ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| දිනට අයවිය යුතු මුදල රු.77,235,211 ක් විය. එසේම රු.5,188,694 ක් විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදලෙන් අයකර ගැනීමට නිලධාරීන් 05 දෙනෙක් කැමැත්ත ප්‍රකාශ කර තිබුණද 2022 දෙසැම්බර් 31 දින වන විටත් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කැමැත්ත පලකර තිබූ නිලධාරීන් 05 දෙනාගේ අර්ථසාධක අරමුදලෙන් අයකර ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති බව. | |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව/ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රයේ වියදම් සඳහා 2020 හා 2022 වර්ෂවල ලැබුණු එකතුව රු.2,090,357 ක් අදාල කාර්යයන් සඳහා වැය කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතියට අදාල කාර්යයන් තවමත් අවසන් වී නොමැති බැවින් 2023 වසරේදී භාවිතයට ගනිමින් පවතින බව. | අදාළ කාර්යයන් සඳහා ලැබුණු අරමුදල් එම වර්ෂවලදී උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේදී කොන්ත්‍රාත් වටිනාකම රු.29,561,377 ක් වූ විශ්වවිද්‍යාලයේ ‘‘කැලේ කඩේ’’ ආපන ශාලාවේ අදියර II හා III වශයෙන් කොටස්කර කොන්ත්‍රාත් 02 ක් එක් කොන්ත්‍රාත්කරුවෙකුට පිරිනමා තිබුණි. මෙම කොන්ත්‍රාත් දෙක 2023 ජනවාරි 13 දින වන විට පිළිවෙලින් දින 1,261 ක් හා දින 1,155 වශයෙන් ප්‍රමාද වී තිබියදී 2022 මැයි 06 දින දෙපාර්ශවයේ එකඟතාවයෙන් කොන්ත්‍රාත්තුව අවසන් කරන ලෙස උපකුලපති උපදෙස් දී තිබුණි. මෙහි කාර්යසාධන සුරක්ෂණයේ වලංගු කාලය ඉකුත් වී තිබීම නිසා රු.1,478,069 ක් අයකරගැනීමට නොහැකි වී තිබුණු අතර ගිවිසුම්වල සඳහන් ප්‍රමාණපත් වටිනාකම් ඉක්මවා රු.6,515,825 ක් ගෙවා තිබුණි. | කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් 2022.05.06 වන දින පැවති විශේෂ ප්‍රගති සමාලෝචන රැස්වීමේදී අදාල පාර්ශවයන් දෙකෙහි අන්‍යෝන්‍ය එකඟතාවය මත කොන්ත්‍රාත්තුවෙහි වැඩ අවසන් කිරීමට තීරණය වූ අතර අදාල කොන්ත්‍රාත් වටිනාකම තුල ගෙවීම් සිදු කර ඇති බව. | කොන්ත්‍රාත් නියමිත කාලයේදී අවසන්කර ගැනීමට ක්‍රියාකලයුතු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයට අනුව කටයුතු කල යුතුය. |
| (ආ) | ශක්‍යතා අධ්‍යයනයක් කර ව්‍යාපෘතිය කරගෙන යාමේ හැකියාව නිශ්චය කිරීමකින් තොරව ශ්‍රවනාගාරයක් ඉදිකිරීම වෙනුවෙන් උපදේශන ගාස්තු හා සැලසුම් සකස් කිරීම සඳහා 2016 වර්ෂයේ රු.5,794,676 ක් වැය කර තිබුණද සමාලෝචිත වර්ෂය දක්වා එම කාර්යය ඉටුකර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය විශ්වවිද්‍යාලයට අත්‍යවශ්‍ය ව්‍යාපෘතියක් බැවින් භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ඉල්ලීමට කටයුතු කරනු ලබන බව. | නිසි ශක්‍යතා අධ්‍යනයකින් පසු ව්‍යාපෘති කරගෙන යාමේ හැකියාව අනුව සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |